වගා ආධාර චක්‍රලේඛ. 49,
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
අංක 70, පාර්ලිමේන්තු පාර,
පැ ලවත්ත, බත්තරමුල්ල
1997. පෙබරවාරි මස 20.. දින

සියලුම ප්‍රාදේශීය කළමණාකරුවන් වෙත,
ව්‍යාප්ති නිලධාරී,
නෑගල්ල/කළුතර.

මාතෘකාව

**1997 වර්ෂය සඳහා අලුත් වගා අවසර පත්‍ර නිකුත් කිරීම.**

1.0 **චක්‍රලේඛයේ පරමාර්ථය**

1.1 තේ ව්‍යාපාරයට අලුතෙන් එකතුවන කුඩා පරිමාන වගාකරුවන්ට තේ ව්‍යාපාරය තුලින් ජීවනෝපාය මාර්ගය සැලසීම.

1.2 රාජ්‍ය ප්‍රතිපත්ති මත බදු දී ඇති අඝ ප්‍රදානය කර ඇති හෝ පරිහරණයට අවසර දී ඇති රජයේ ඉඩම් සංවර්ධනය කිරීමට පියවර ගැනීම.

1.3 කුඩා තේ වතු සංවර්ධන සමිති සාමාජිකත්වය වර්ධනය කරවීම.

1.4 නැවත වගාවට සුදුසු ඉඩම් නැවත වගා කරන අතරම තේ වගා ප්‍රදේශවල අලුත් වගාවට සුදුසු ඉඩම් අලුතින් වගා කොට සංවර්ධනය කිරීම.

2. **ක්‍රියා මාර්ගය.**

2.1 දැනටමත් ඔබ වෙත සපයා දී ඇති රෝසපාටින් මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පමණක් මේ සඳහා යොදා ගන්න.

2.2 කුඩා තේ වතු සංවර්ධන සමිතිය සාමාජිකත්වය ලබා ඇති අක්කරයකට අඩු බිම් ප්‍රමාණයක් සහිත ඉඩම් හිමියන්ට පමණක් මෙම ක්‍රමයට සහභාගිවිය හැකිය. එක් අයෙකුට අක්කර 1/2 බිම් ප්‍රමාණයකට උපරිමයකට යටත්ව අවසර පත්‍ර නිකුත් කල හැකිය.

2.3 වර්ණ මුද්‍රිත ඉල්ලුම් පත්‍ර තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී මගින් සමිති හරහා ඉල්ලුම්කරුවන් වෙත නිකුත් කර සමිතියේ නිර්දේශය සහිතව ආවරණ ලිපියක් සමග ඔබ වෙත 1997.03.15 දිනට ප්‍රථම ලබා ගැනීමට කටයුතු කල යුතුය. තවද ඉල්ලුම් පත්‍ර ලද වහාම මූලික පරීක්ෂනය සඳහා යොමු කරන්න.

2.4 මූලික පරීක්ෂණ වලදී තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී නිර්දේශ පරිදි පස සාරවත් කිරීම සහිතව තේ වගා කල යුතු ඉඩම් වල පස සාරවත් කිරීමට යටත්ව තේ වගා කල යුතු බවටද එසේ නිර්දේශ නොකරන ඉඩම් පස සාරවත් කිරීමෙන් තොරවද තේ වගා කිරීමට අවසර දිය යුතුය. මූලික පරීක්ෂණවල නියැදියක් අධීක්ෂක තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී මගින් [illegible] පරීක්ෂණයට ලක්කල යුතු අතර එම පරීක්ෂණවල නියැදියක් ප්‍රාදේශීය ජ්‍යෙෂ්ඨ නිලධාරී, සහකාර ප්‍රාදේශීය කළමණාකරු (ව්‍යා) සහ ප්‍රාදේශීය කළමණාකරු විසින් පරීක්ෂා කළ යුතුය.

( .... 2 [illegible]

(V....2 පිටුව

2.5 මේ අනුව මූලික පරීක්ෂණ වාර්තා ලබාගෙන 1997 අප්‍රේල් 30 දිනට ප්‍රථම අවසර පත්‍ර නිකුත් කර අවසන් කර අදාල අදාල අවසර පත්‍ර සංඛ්‍යාව සහ බිම් ප්‍රමාණය සමිති අනුව මා වෙත වාර්තා කළ යුතුය.

2.6 1996.06.24 දිනැති අංක 48 දරණ වගා සහනාධාර චක්‍රලේඛයෙහි (අ) යටතේ වූ දිස්ත්‍රික්කවලට අමතරව බදුල්ල දිස්ත්‍රික්කයද ඇතුලත් කළ යුතුය. තවද එහි (ආ) 3 යටතේ පරිදි ඉඩම් පරීක්ෂාවේදී සැලකිය යුතු කරුණු පිළිබඳව මෙහිදී ද විශේෂයෙන්ම අවධානය යොමු කළ යුතුය.

2.7 පස සාරවත් කිරීම රහිතව තේ වගාවට අවසර දෙනු ලබන ඉඩම්වල 1997 වර්ෂයේ එළඹෙන වගා කන්න දෙක ඇතුලතදී අනිවාර්යෙන්ම වගා කටයුතු අවසන් කල හැකි අයදුම්කරුවන්ට පමණක් මේ සඳහා අවසර දිය යුතුය. එහිදී ' 1997 වර්ෂය තුලදීම තේ පැල සිටුවා අවසන් කළ යුතුය,,' යන්න එන්පී 7 ඒ අවසර පත්‍ර ආවරණ ලිපියට හා අවසර පත්‍රයට රබර් මුද්‍රාවක් මගින් ඇතුලත් කොට එය අදාල ප්‍රකාශනය මගින් සනාථ කරවා ගත යුතුය. මේ යටතේ නිකුත් කරන අවසර පත්‍ර කොනමා හේතුවක් නිසාවත් නැවත දීර්ඝ නොකළ යුතු අතර 1997 වර්ෂයේ තේ පැල සිටුවා ගෙවීම් සඳහා ඉදිරිපත් නොවුවහොත් අවලංගු වනු ඇත.

2.8 ඒ ඒ ප්‍රාදේශීය කාර්යාල හා ව්‍යාපෘති කාර්යාල සඳහා මෙම වර්ෂය තුලදී ගෙවීම් කිරීම පිණිස ප්‍රතිපාදිත මුදල් ප්‍රමාණය ඒ අනුව අවසර දිය හැකි බිම් ප්‍රමාණය පහත දැක්වේ.

| දිස්ත්‍රික්කය | 1997 සඳහා අවසර දියහැකි බිම් ප්‍රමාණය හෙක්ටාර් | ප්‍රතිපාදිත සහනාධාර මුදල රුපියල්. මිලියන |
|---|---|---|
| ගාල්ල | 60 | 2.25 |
| මාතර | 80 | 3.00 |
| කළුතර | 100 | 3.5 |
| කෑගල්ල | 60 | 2.25 |
| රත්නපුර | 100 | 3.5 |
| හම්බන්තොට | 20 | 1.0 |
| බදුල්ල | 20 | 1.0 |
| එකතුව | 440 | 16.5 |

සටහන: මෙය ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය මගින් ප්‍රතිපාදන මුදලට අතිරේකවය. 1995/96 අවසර පත්‍ර යටතේ ඉතිරි වාරික ගෙවීම හා චක්‍රලේඛ අංක 45 පරිදි දීර්ඝ කිරීම වලංගු අවසර පත්‍ර වෙනුවෙන් ගෙවීම්ද ඇතුලත්ය.

.. 3 පිටුවට.

103

2.10 ඉහත ප්‍රතිපාදිත මුදල නොඉක්මවා මේ සඳහා මෙම වර්ෂයේ වියදම් දැරීමට කටයුතු කළ යුතු අතර, යම් හෙයකින් ප්‍රතිපාදිතය ඉක්මවීමට සිදුවේ නම් ඒ බව කල් තබා මා වෙත වාර්තා කළ යුතුය.

ඉහත සඳහන් බිම් ප්‍රමාණය ඔබගේ ක්ෂේත්‍ර කොට්ඨාශ මට්ටමින් වාර්ෂික සැලැස්මට ඇතුලත් කොට දැනටමත් හඳුන්වා දී ඇති ඇගයීම් ක්‍රම මගින් විධිමත් ඇගයීමක් පවත්වාගෙන යාමට කටයුතු කරන්න.

(රෝහණ ඉලංගරත්න)
සභාපති.

පිටපත් :-

1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාප්ති)
22. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන)
3. සහකාර සාමාන්‍යාධිකාරී (සංවර්ධන)
4. ගාල්ල/මාතර/කලුතර/කෑගල්ල/රත්නපුර/ඌව — ක්‍රියාත්මක කිරීමට.
5. තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්. මහනුවර/ — දැන ගැනීම සඳහා.
   නුවරඑළිය.
6. ප්‍රාදේශීය සමිති සංවිධානය — අදාළ සමිති වලට දැනුම් දීමට.
7. සියලුම මාණ්ඩලික නිලධාරීන්.
8. අභ්‍යන්තර විගණක.

ම/02/15